OL/2014/15/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

| 15 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

| | | |
|---|---|---|
| **ක්‍රිස්තියානි ධර්මය** | **I, II** | **පැය තුනයි** |
| கிறிஸ்தவம் | **I, II** | மூன்று மணித்தியாலம் |
| Christianity | **I, II** | *Three hours* |

## ක්‍රිස්තියානි ධර්මය I

**සැලකිය යුතුයි :**
(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. මරියතුමියගේ උදාර ගුණාංග චරිතායතනය කරන ඔබ
   (1) නින්දා අපහාස ගණන් නොගත යුතු ය.
   (2) පූර්ණ දේව විශ්වාසයෙන් ක්‍රියා කළ යුතු ය.
   (3) විශේෂ පුවත් ගැන උදම් ඇණිය යුතු ය.
   (4) කල්පනාකාරී ව තීරණ ගත යුතු ය.

2. සැබෑ කිතුනු ශ්‍රාවකත්වයට ඇතුළු වීමට නම්
   (1) ජේසු කැඳවීම ලත් සැණින් කීකරු විය යුතු ය.
   (2) දියඹට යාමට සූදානම් විය යුතු ය.
   (3) වගකීම් දැරීමට හැකි ද යන්න සිතා බැලිය යුතු ය.
   (4) දෙමව්පියන් හට යුතුකම් ඉටු කළ යුතු ය.

3. " අද අපි හරි පුදුම දේ දුටුවෙමු" සෙනඟ මෙසේ පැවසුවේ කවරෙකු සුව කළ අවස්ථාවේ දී ද?
   (1) දිය උදර රෝගියා
   (2) ලාදුරු රෝගියා
   (3) අංශභාග රෝගියා
   (4) ශතාධිපතියාගේ දාසයා

4. ජේසුතුමාගේ සමීපතම ඥාතිත්වයට පත් වන්නේ
   (1) වැඩි කාලයක් දෙව් මැඳුරේ රැඳී සිටින්නන් ය.
   (2) ප්‍රේමය දක්වන්නන් ය.
   (3) පසු තැවෙන්නන් ය.
   (4) දේව වචනය පිළිපදින්නන් ය.

5. පරිසිවරුන් බෞතිස්ම ස්නාපනය යොදා ගත්තේ
   (1) ඇතැම් අයගෙන් වෙන්කර ගැනීම සඳහා ය.
   (2) තමන් කැපීපෙනීම සඳහා ය.
   (3) මනස්ථාපනය වීම සඳහා ය.
   (4) ශුද්ධාත්මය ලැබීමට පහසු වීම සඳහා ය.

6. සාකෙවුස් මෙන් නව ප්‍රවේශයක් පතන කිතුනුවා
   (1) තමාගේ වස්තුව දිළිඳුන්ට බෙදා දිය යුතු ය.
   (2) සිත අභ්‍යන්තරයට එබී බැලිය යුතු ය.
   (3) ආගන්තුක සත්කාරයට නැඹුරු විය යුතු ය.
   (4) දෙවිඳුන් අලුතින් අත්දැකීමට යොමු විය යුතු ය.

7. කිතුනු ප්‍රේමය වඩාත් ප්‍රායෝගික වූ අවස්ථාවක් හා බැඳෙන්නේ
   (1) මවගේ ශල්‍යකර්මය සඳහා පුතා රුධිරය පරිත්‍යාග කිරීම ය.
   (2) විවාහ වීමට සිටි තැනැත්තිය මිය ගිය නිසා කිසිදා විවාහ නොවී සිටීමට යමෙකු තීරණය කිරීම ය.
   (3) තම ඉඩම කොල්ල කෑ තැනැත්තාට වකුගඩුවක් පරිත්‍යාග කිරීම ය.
   (4) වැඩිහිටි නිවාසයකට දන් දීම ය.

8. වපුරන්නාගේ උපමාවේ සඳහන් ලෙස කිතුනු ඔබ විශේෂයෙන් අපේක්ෂා කළ යුත්තේ
   (1) දේව රාජ්‍යය වෙනුවෙන් ඵල දැරීම ය.
   (2) ස්වයං ආත්මික වර්ධනයක් ඇති කර ගැනීම ය.
   (3) දේව වචනය භාවනාවට යොදා ගැනීම ය.
   (4) දේව වචනය අලංකාර ගල් පුවරුවල සටහන් කිරීම ය.

9. ලාසරුස්ට නොසැලකූ ධනපතියාට **ප්‍රතිවිරුද්ධව** ක්‍රියා කළ යුතු කිතුනුවා
   (1) ප්‍රේමනීය හැඟීමෙන් යුතුව දිළිඳුන් සැලකිය යුතු ය.
   (2) සැප සම්පත් නොමැතිව ජීවත් විය යුතු ය.
   (3) තම ධනය රිසි ලෙස පරිහරණයෙන් වැළකිය යුතු ය.
   (4) මහමඟ සිටින යාචකයින් සොයා යා යුතු ය.

[ දෙවෙනි පිටුව බලන්න

10. පාවුල් දුක් පීඩා සහ අභියෝගවලට මුහුණ දෙමින් ජය ගත්තේ
(1) පර්ගාවේ දී ය. (2) ඇතැන්ස්හි දී ය. (3) පිලිප්පියේ දී ය. (4) කොරින්තියේ දී ය.

11. කුරුසිපත් ජේසුස් වහන්සේ පිළිබඳ ව සිය හදවතින් ම ප්‍රබල සාක්ෂියක් ඉදිරිපත් කළේ
(1) පසුතැවිලි වූ වරදකරුවා ය. (2) කිරේනියේ සීමොන් ය.
(3) රෝම ශතාධිපතියා ය. (4) අරිමාතියේ ජෝසෙප් ය.

12. ශ්‍රී ලාංකික කිතුනු අප ජාතික සිරිත් පැවැත්විය යුත්තේ
(1) ජාතිකාභිමානය පමණක් ඉස්මතු වන ලෙසිනි. (2) සෙසු අය අකුරට ම අනුකරණය කරමිනි.
(3) කිතුනු පැවැත්මට පටහැනි නොවන ලෙසිනි. (4) තමාට හැකි පමණට ය.

13. ලෞකික රාජ්‍යයේ නීතියටත්, දෙවිඳුන්ටත් පූර්ණ කැපවීමෙන් ක්‍රියා කළ යුතු බව දැක්වෙන ජේසු ප්‍රකාශය කුමක් ද?
(1) "ඔබ සතු දේ විකුණා දිළිඳුන්ට දෙන්න."
(2) "කුරුසිය දරාගෙන මා අනුව නොඑන ....... මාගේ ගෝලයකු විය නොහැකි ය."
(3) "සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්න."
(4) "සියලු ආකාර තණ්හාවලින් පරෙස්සම් වන්න."

14. ස්වාභාවික ව්‍යසන අවම කිරීම සඳහා
(1) ව්‍යසනවල සැබෑ තත්ත්වය පිළිබඳ ව ජනතාව දැනුවත් කළ යුතු වේ.
(2) දෙව් මිනිස් හා මිනිස් පාරිසරික සබඳතාව සුරක්ෂිත කළ යුතු වේ.
(3) නව තාක්ෂණික උපකරණ භාවිතයෙන් වැළැකිය යුතු වේ.
(4) ස්වාභාවික ව්‍යසන පිළිබඳ ලිපි ලේඛන සුලභ කළ යුතු වේ.

15. වර්තමාන සමාජයේ සිටින පිලාත් වැන්නකුගේ ප්‍රබල ම පාපෝච්චාරණය වන්නේ
(1) "චූදිතයා අපරාධකරුවකු ලෙස හංවඩු ගැසුවෙමි" යන්නයි.
(2) "නීතිය අකුරට ම ක්‍රියාත්මක නොකළෙමි" යන්නයි.
(3) "මහජන මතයට හිස නොනැමුවෙමි" යන්නයි.
(4) "තනතුර රැක ගැනීම සඳහා සාධාරණ යුක්තියට පිටුපෑවෙමි" යන්නයි.

16. කිතුනු මෙහෙවරෙහි යෙදීම පිළිබඳ ව පාවුල්ගේ විශේෂ මග පෙන්වීම වන්නේ
(1) අවස්ථානුකූල නිවැරදි ක්‍රමවේද භාවිතයයි. (2) ජනතා ප්‍රතිචාර ප්‍රචලිත කිරීමයි.
(3) සමහර විට පමණක් නායකත්ව භූමිකාව රඟපෑමයි. (4) මුදල් මත යැපීමයි.

17. ජේසුතුමා සමඟ පෞද්ගලික සබඳතාවකට පත්වන්නකු
(1) අර්ථවත් ජීවිතයක් ගත කළ යුතු ය.
(2) සමාජයට වැඩදායක පුද්ගලයකු වීමට උත්සාහ ගත යුතු ය.
(3) තමන් තුළින් ජේසුතුමා පිළිබිඹු වන ලෙසට ජීවත් විය යුතු ය.
(4) තම ජීවිත අත්දැකීම් සමාජයට හඬ ගා පැවසිය යුතු ය.

18. දේව රාජ්‍යයේ පුරවැසියන් යටහත් පහත්ව ක්‍රියා කිරීම සඳහා ආකල්ප මාරුවකට යොමු කරනුයේ
(1) මහා මංගල භෝජනය පිළිබඳ උපමාවයි.
(2) නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාවයි.
(3) වැන්දඹුවගේ පරිත්‍යාගශීලී පඬුර පිළිබඳ සිද්ධියයි.
(4) ආගන්තුක සත්කාර පිළිගැනීම හා පිළිගැන්වීම පිළිබඳ ඉගැන්වීමයි.

19. කිතුනු සමාජයට අදාළ කරුණු කිහිපයක් පහත දැක්වේ.
A - සාමකාමී සහජීවනය තුළින් දේව රාජ්‍යයේ අගයයන් කරා සමාජය පරිවර්තනය කිරීම
B - සමාජය තුළ සහෝදරත්වය අභිමිවූවන් ප්‍රේමයෙන් පිළිගැනීම
C - සමාජය තුළ කිතු දහම දේශනා කිරීම
D - සමාජය තුළ පරෝපකාර සමිති පිහිටුවීම
යහපත් කිතුනු පවුලක ප්‍රධාන සමාජ වගකීම් වන්නේ
(1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) C සහ D ය.

20. අනාගත කිතුනු සභාවේ එඬේර වගකීම භාර ගත යුතු ඔබ විසින් කළ යුත්තේ
(1) කිතුනු රැළ සංඛ්‍යාත්මකව වර්ධනය කිරීම ය.
(2) කිතුනුවන් එකමුතු කිරීමට පමණක් උත්සාහ ගැනීම ය.
(3) ක්‍රිස්තුන් වහන්සේ පසු පස ම යාමට කිතුනුවන් දිරිමත් කිරීම ය.
(4) ක්‍රිස්තුන් වහන්සේ අත්හැර ගිය අය නැවත දිනා ගැනීම ය.

21. "අපිත් ඔබ හා සමාන මිනිස්සු ය." එදා පාවුල්ගේ හඬට **ප්‍රතිවිරුද්ධ** ඇ අද ඇසෙන්නේ
(1) මිනිසා හාස්කම් පසුපස පමණක් දිව යන බැවිනි.
(2) අද ජාන තාක්ෂණය ප්‍රචලිත වෙමින් පවතින බැවිනි.
(3) සමානාත්මතාවය ලෝකය පිළිගෙන ඇති බැවිනි.
(4) අවධානය තමා වෙතට යොමු කර ගැනීමට කැමති වන බැවිනි.

[ තුන්වෙනි පිටුව බලන්න

22. දුක් විඳීම පිළිබඳ කිතුනු ආකල්පය කුමක් ද?
    (1) පාපයට දඬුවමක් ලෙස දුක් විඳීමට සිදු වන බවයි.
    (2) දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා දුක් විඳීම ප්‍රීතියක් බවයි.
    (3) දුක් විඳින්නන්ට පිහිට වීමේ දී කිතුනුවාට දුක අත්නොවන බවයි.
    (4) ජේසුතුමාට මෙන් සියල්ලන්ට දුක් විඳීමට සිදු වන බවයි.

23. "කුඩා දරුවකු පැහැර ගනී." - ප්‍රවෘත්තියක්
    මෙවැනි සමාජයක කිතුනු දරුවන්ගේ වගකීම වන්නේ
    (1) නිර්භීත ව ක්‍රියා කිරීමයි.
    (2) නිවසේ රැකවරණයෙන් පිටව නොයෑමයි.
    (3) සැමගේ ම ආරක්ෂාව ගැන සැලකිලිමත් වීමයි.
    (4) සැම ඉරිදාවක් පාසා ම දහම් පාසලට පැමිණීමයි.

24. "කිකිළියක ඇගේ පැටවුන් සිය පියාපත් යටට එක්රැස් කරන්නාක් ලෙස" ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් පිළිබඳව ද?
    (1) ජෙරුසලම් වැසියන් (2) බෙත්සයිදා වැසියන් (3) ගලීලයේ වැසියන් ය. (4) සකල ලෝ වැසියන්

25. අසත්‍ය චෝදනා හා අර්බුදවලට සහනය පිණිස කිතුනුවන්ට ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.
    A - පිහිටක් ලැබේ යැයි සිතෙන ඕනෑම ස්ථානයකට ඔවුන් යොමු කිරීම
    B - නිහඬව දරා ගැනීමෙන් ප්‍රශ්න ජය ගැනීමට මග පෙන්වීම
    C - ඇඩි ආත්ම විශ්වාසයෙන් කටයුතු කිරීමට සැලැස්වීම
    D - දෙවිඳුන් වෙතින් යැපීමට ඔවුන් යොමු කිරීම
    මේවායින් පාවුල්ගේ මග පෙන්වීමට අනුව වඩාත් නිවැරදි වන්නේ
    (1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) C සහ D ය.

26. වත්මන් කිතුනු සභාවට මුල් කිතුනු සභාවෙන් ලැබෙන සුවිශේෂී මග පෙන්වීම වන්නේ, යාච්ඤාවෙන්
    (1) සභා සාමාජිකයින්ගේ ආර්ථික වර්ධනයට අත දීම ය.
    (2) ඉගැන්වීම හා සාමූහිකත්වය තුළින් සභාව ඉදිරියට ගෙන යාම ය.
    (3) සභාව ව්‍යාප්ත නොවූ ප්‍රදේශ හඳුනා ගැනීමට ක්‍රියා කිරීම ය.
    (4) අන්‍යාගමික සංස්ථා පිටුදැකීමට ක්‍රියා කිරීම ය.

27. ඔබේ දේවස්ථාන පලාතේ ආර්ථික දරිද්‍රතාවෙන් පෙළෙන්නන් සිටී නම්
    (1) ඔවුන්ට වියළි ආහාර සැපයිය යුතු ය.
    (2) දේවස්ථාන භූමිය වගා කිරීමට ඉඩ සැලසිය යුතු ය.
    (3) දරිද්‍රතාව ඇති වීමට හේතු විමසා ක්‍රියා කළ යුතු ය.
    (4) සතිපතා බයිබල් අධ්‍යයනයක් පැවැත්විය යුතු ය.

28. ශුද්ධ සහභාගිකමේ දේව මෙහෙය සම්බන්ධයෙන් කරුණු කිහිපයක් පහත සඳහන් වේ.
    A - එය ඓතිහාසික පිළිවෙතක් වේ.
    B - සහෝදරත්වය හා සහභාගිත්වය වර්ධනය කරන්නක් වේ.
    C - ක්‍රිස්තු ශරීරයට හවුල්කරුවන් වීමේ ප්‍රබල සංකේතයක් වේ.
    D - 5000 කට කෑම දීමේ සිද්ධිය සිහිපත් කරන්නක් වේ.
    කිතුනුවෙකුට මෙයින් වඩාත් වැදගත් වන්නේ
    (1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) C සහ D ය.

29. යහපත් සමාරිතයා මෙන් පොදු යහපතට ක්‍රියා කිරීමේ දී අප අදිටන් කළ යුත්තේ
    (1) "ඔබේ ප්‍රශ්න ඔබේ ය. මගේ ප්‍රශ්න මගේ ය" යන්නයි.
    (2) "මට අයිති දෙය ඔබේ අවශ්‍යතාවයට කැප කරමි" යන්නයි.
    (3) "ඔබට අයිති දෙය මට ද දිය යුතු ය" යන්නයි.
    (4) "මා ප්‍රමුඛතාව දෙන්නේ මගේ රාජකාරියට ය" යන්නයි.

30. යාච්ඤාව පිළිබඳ කිතුනු ආකල්පයට වඩාත් ම ගැළපෙන යැදුම කුමක් ද?
    (1) "සමිඳුනි, කෙසේ හෝ විදේශගත වීමට මට පිහිට වුව මැනව."
    (2) "සමිඳුනි, මගේ විරුද්ධවාදීන්ගෙන් මා බේරා ගනු මැනව."
    (3) "සමිඳුනි, මට සතුරුකම් කරන්නන්ට සමාව දීමට මට පිහිට වුව මැනව."
    (4) "සමිඳුනි, මගේ දරුවාට අන් අය පරදා වැජඹීමට පිහිට වුව මැනව."

31. ප්‍රේමයේ ජීවිත ගත කළ යුතු කිතුනුවා, පාවුල් තුමාගේ ප්‍රේම පාරමිතාවට අනුව
    (1) නපුර පිළිකුල් කොට ප්‍රේම කරන්නන්ට ප්‍රේම කළ යුතු ය.
    (2) ඉවසිලිවන්ත විය යුතු අතර ඊර්ෂ්‍යා නොකළ යුතු ය.
    (3) සහෝදර ප්‍රේමයෙන් ප්‍රේම කළ යුතු ය.
    (4) අසල්වැසියාට ප්‍රේම කළ යුතු ය.

[හතරවෙනි පිටුව බලන්න

32. නාසරෙත් ධර්ම ශාලාවේ ජේසු දේශනය වර්තමානයේ ප්‍රායෝගික කිරීමට නම්, කළ යුත්තේ
(1) දිනපතා ශුද්ධ ලියවිලි හැදෑරීම ය.
(2) අන්‍යාගමිකයන් හා අන්‍ය ජාතීන් වර්ණනා කිරීම ය.
(3) වැඩි පිරිසක් සභාවට බඳවා ගැනීම ය.
(4) හිංසා සහ පීඩනයට පත් අයට සහනය දීම ය.

33. වර්තමාන ධර්ම දූතයින්ට එළඹෙන අභියෝග සමහරක් පහත දැක්වේ.
A - ප්‍රතික්ෂේපයට ලක් වීමේ ප්‍රවණතාවක් තිබීම
B - යටහත් පහත් වීමට සිදු වීම
C - අහිංසකත්වයේ සහ සාමයේ ප්‍රතිමූර්තීන් වීම
D - පුරසාරම් කීමෙන් සහ ඒවාට සවන් දීමෙන් වැළකී සිටීම
“වගවලසුන් මැදට බැටළු පැටවුන් යවන්නාක් මෙන් ඔබ යවමි.” යන ජේසුස් වහන්සේගේ කියමනට වඩාත් ගැළපෙන්නේ
(1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) C සහ D ය.

34. “යමෙකු වතුරෙන් ද ආත්මයාණන්ගෙන් ද නූපන්නොත් ඔහුට ස්වර්ග රාජ්‍යයට පිවිසිය නොහැක.” මෙය ජේසුස් වහන්සේ පැවසුවේ
(1) නිකදේමුස්ට ය.
(2) පේදුරුට ය.
(3) ස්නාවක ජොහන්ට ය.
(4) මග්දලායේ මරියාට ය.

35. කිතුනුවා, ක්‍රිස්තුන් වහන්සේ නමැති සැබෑ මිදිවැලට ඒකාබද්ධ වීම තුළින්
(1) සමස්ත සමාජය ම ඒකත්වයට ඇතුළත් කර ගත හැකි වේ.
(2) සමෘද්ධිමත් ජීවිත ගත කිරීමට හැකි වේ.
(3) කිතුනු සාරධර්ම පතුරුවාලිය හැකි වේ.
(4) බේද ඇති කරන්නන් නිරුත්තර කළ හැකි වේ.

36. එම්මාවුස් කරා ගිය ගෝලයින්ගේ හදවත් දැවී ඇවිලී ගියේ, ජේසුස් වහන්සේ
(1) කල්වාරි පුවත නොදන්නා බව පැවසූ විට ය.
(2) ශුද්ධ ලියවිලි පහදා දුන් විට ය.
(3) රොටි ගෙන ආශීර්වාද කළ විට ය.
(4) එම්මාවුස් පසු කර යාමට සැරසුණු විට ය.

37. “ඔබ සොරකු හා සටනට මෙන් කඩු මුගුරු රැගෙන ආවහු ද?” ජේසුස් වහන්සේගේ මෙම කියමනෙන් කිතුනුවන්ට ලැබෙන අභියෝගය වන්නේ
(1) පාපයේ අතිභයංකර ස්වරූපයට මුහුණ දීමට සැරසිය යුතු බවයි.
(2) අදම්ටුකම් ඉදිරියේ නිර්භීත ව නොසැලී සිටිය යුතු බවයි.
(3) නොසිතූ අවස්ථාවල ප්‍රශ්න මතු විය හැකි බවයි.
(4) ශාරීරික හා ආධ්‍යාත්මික සටන් ඒකාබද්ධ විය හැකි බවයි.

38. අප රටේ බහුවිධ සමාජය තුළ සාමය සහ සහජීවනය ඇති කිරීම සඳහා කිතුනුවා කළ යුත්තේ
(1) කිතුනු උත්සව සඳහා සියල්ලන් සහභාගි කරවා ගැනීම ය.
(2) සියලු ම වහල් භාවයන් පිටුදැකීමට උත්සුක වීම ය.
(3) දේව සබඳතාව සහ මානව සබඳතා වර්ධනය කිරීම ය.
(4) වගාවෙන් පමණක් පරිසරය සංරක්ෂණය කිරීම ය.

39. කිතුනු බලාපොරොත්තු පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - කිතුනු බලාපොරොත්තුවේ පදනම ක්‍රිස්තු උත්ථානයයි.
B - කිතුනු බලාපොරොත්තුව පෞද්ගලිකත්වය මත ගොඩනගා ගත හැකි ය.
C - ඉශ්‍රායෙල් ජනතාව බලාපොරොත්තු රඳවූයේ ව්‍යවස්ථාව මත ය.
D - කිතුනු බලාපොරොත්තුව නම් ශුද්ධ සහභාගිකමේ මෙහෙය දේවරාජ්‍යය උරගා බැලීමකි.
මින් වඩාත් නිවැරදි වන්නේ
(1) A සහ B ය. (2) A සහ D ය. (3) B සහ C ය. (4) C සහ D ය.

40. ‘සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයේ’ වැඩි වශයෙන් ඇතුළත් වී ඇත්තේ
(1) මිදීමේ පණිවිඩය පිළිබඳ සතුටයි.
(2) ජුදෙව් බලාපොරොත්තුවක් සම්පූර්ණ වීමේ සතුටයි.
(3) තම පුත්‍රයා පෙරමග දූතයා වීමේ සතුටයි.
(4) තම පුත්‍රයා ජනතාව මනස්ථාපනයට කැඳවීමේ සතුටයි.

**

[පස්වෙනි පිටුව බලන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**15 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

**ක්‍රිස්තියානි ධර්මය** I, II
கிறிஸ்தவம் I, II
Christianity I, II

## ක්‍රිස්තියානි ධර්මය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

**1.** (i) ජේසුස් වහන්සේගේ උපත සිදුවන කාලයේ දී පලස්තීන දේශය කුමන අධිරාජ්‍යයකට යටත් ව පැවතුණේ ද? එය පාලනය කළ අධිරාජ්‍යයා කවුද?

(ii) ලූක් සුබසුන අනුව ජේසුස් වහන්සේට එල්ල වූ තුන්වන පරීක්ෂාව කුමක් ද? එවැනි පරීක්ෂාවක් උන්වහන්සේට නැවත එල්ල වූයේ කුමන අවස්ථාවේ දී ද?

(iii) විනයධරයන් වෙත ජේසුස් වහන්සේ එල්ල කළ චෝදනා **දෙකක්** ලියන්න.

(iv) දේව රාජ්‍යයේ ප්‍රතිපත්තියක් වන නැතිවූවන් සොයා යාම පිළිබඳ ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ උපමා **දෙකක්** දක්වන්න.

(v) ලූක් සුබසුන අනුව ජේසුස් වහන්සේ සිය කුරුසිපත් වීමට පෙර ක්‍රියාත්මක කළ සංකේතවත් ක්‍රියා **දෙක** කවරේ ද?

(vi) "ජීවමාන තැනන් වහන්සේ මළවුන් අතර සොයන්නේ මන් ද?" මෙම ප්‍රකාශය කළේ කුමන අවස්ථාවේ දී ද? එයින් කිතුනු අප ලබන සුපුවත කුමක් ද?

(vii) 'මෙසියස්' යන්න කුමන භාෂාවකින් ආ වචනයක් ද? එහි අර්ථය කුමක් ද?

(viii) මුල් කිතුනුවන් අතර වේද සාක්ෂිකයා ලෙස සැලකෙන්නේ කවරෙක් ද? මරණ මොහොතේ ඔහු පැවසූ කුමන වදන් ජේසුස් වහන්සේ කුරුසිය මත පැවසූ කුමන වදනට සමාන වන්නේ ද?

(ix) ජුදෙව් සමාජයත් ශ්‍රී ලාංකික සමාජයත් සැසඳීමේ දී දක්නට ලැබෙන යහපත් සමානකම් **දෙකක්** ලියන්න.

(x) "ජුදෙව් සහ විජාතීන් එක් කරමින් උන්වහන්සේ සමගිය ඇති කළ සේක. වෛරය නමැති මැද බිත්තිය කඩා දැමූ සේක." මෙයින් බහුවිධ සමාජයේ අප ලබන ආදර්ශ **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 2 × 10 = 20යි)

**2.** (i) "ඇද නැති මාවත් සකස් කිරීම සඳහා වනයේ මොරගසන්නකුගේ ශබ්දය" ගැන ප්‍රකාශ කළේ කුමන දිවැසිවරයා ද? කාගේ ක්‍රියාකලාපයක් ගැන ද?

(ii) පහත සඳහන් කියමන් ලුහුඬින් පහදන්න.

(අ) ඇද නැති මාවත් සෑදීම

(ආ) කඳු හෙල් සමතලා කිරීම

(ඉ) සියලු රළු මාවත් මට්ටම් කරනු ලැබීම

(iii) අද ඔොහු අප අතරට පැමිණියහොත්, කිතුනු ඔබට හා සමාජයට දෙන අභියෝග හා පසුතැවිල්ලට කැඳවනු ලබන්නේ කවර දේ පිළිබඳව දැ'යි විස්තර කරන්න.

(ලකුණු 10යි)

**3.** "මාර්තා, මාර්තා, ඔබ බොහෝ දේ ගැන කරදර වෙමින් නළංගු වන්නේ ය. .....මරියා **යහපත් දෙය** තෝරාගෙන ඇත. එය ඇය කෙරෙන් පැහැර ගනු නොලැබේ."

(i) ජේසුස් වහන්සේ මෙසේ පැවසීමට පසුබිම් වූ අවස්ථාව කුමක් ද? තද කළු අකුරෙන් යෙදා ඇති පදයේ අර්ථය පහදන්න.

(ii) ජුදෙව් සමාජය තුළ කාන්තාවන්ට තිබූ තහංචි අභිබවා ඔවුනට පිළිගැන්මක් ලබා දීමට ජේසුස් වහන්සේ ක්‍රියා කළ අන්දම දැක්වෙන අවස්ථා **තුනක්** උදාහරණ සහිත ව ඉදිරිපත් කරන්න.

(iii) පුරුෂාධිපත්‍යයෙන් යුත් සමාජයක කාන්තා භූමිකාවට පිළිගැනීමක් ලබා දීම සඳහා සභාව තුළින් ඉටු විය යුතු දේ පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

**4.** "ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් අනුව මෙලොවට අවශ්‍ය විමුක්තිය ලබා ගැනීමට මිහිපිට දේවරාජ්‍යය ස්ථාපනය කිරීම අවශ්‍ය වේ."

(i) දේව රාජ්‍යය ප්‍රකාශ කිරීමට ජේසුස් වහන්සේ භාවිත කළ ක්‍රමවේද කවරේ ද?

(ii) එම ක්‍රමවේද යොදා ගැනීමේ දී ගත් ක්‍රියාමාර්ග උදාහරණ සහිත ව පහදන්න.

(iii) අප ජීවත් වන සමාජය තුළ දේවරාජ්‍යයේ වටිනාකම් කිතුනු ඔබගේ ජීවිතය තුළින් හුවා දක්වන්නේ කෙසේ ද?

(ලකුණු 10යි)

[හයවෙනි පිටුව බලන්න

**5.** "සියලු ආකාර තණ්හාවලින් පරෙස්සම් වන්න."

(i) ජේසුස් වහන්සේ මෙසේ ප්‍රකාශ කළ අවස්ථාව කුමක් ද? එයින් ගෙනහැර පාන අනුශාසනය කුමක් ද?

(ii) ලෞකික වස්තු රැස්කිරීමේ අනුවණකම් පැහැදිලි කිරීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ උපමාව සංක්ෂිප්ත ව ඉදිරිපත් කරන්න.

(iii) තරුණ ඔබ සමාජයේ දී මුහුණ දෙන ආශා සහ තණ්හා කවරේ දැ'යි දක්වා, ඒවායින් වැළකීමට ක්‍රියා කළ යුත්තේ කෙසේ දැ'යි පහදන්න. (ලකුණු 10යි)

**6.** "වෛරයෙන් පිරුණු තැනට ප්‍රේමය ද, අසමගියෙන් තුවාල වූ තැනට ශාන්තිය ද, අවිශ්වාසයෙන් යුත් තැනට විශ්වාසය ද, බලාපොරොත්තුව සුන් වූ තැනට බලාපොරොත්තුව ද, ශෝකය වටලා ගත් තැනට ප්‍රීතිය ද ........ ගෙන යෑමට වර දුන මැනවි." – අසීසියේ ෆ්‍රැන්සිස්තුමාගේ යැදුම

(i) ජේසුස් වහන්සේ එවකට සමාජයේ බලාපොරොත්තුව සුන් වූ තැනට, අසමගිය ඇති තැනට, ශෝකය ඇති තැනට, බලාපොරොත්තු, සාමය, ප්‍රීතිය ගෙන දුන් අවස්ථාවලට උදාහරණ දෙන්න.

(ii) අද ලොව ජන සමාජ තුළ වෛරය, අවිශ්වාසය, ශෝකය පවතින්නේ කෙබඳු අයුරින් දැයි විස්තර කරන්න.

(iii) යුක්තිය හා සාධාරණත්වය මත පදනම් වූ සමාජයක් ඇති කිරීමෙහිලා ඉහත කී යාච්ඤාව ඇසුරෙන් ඔබට ඉදිරිපත් කළ හැකි යෝජනා **පහක්** ලියා දක්වන්න. (ලකුණු 10යි)

**7.** (i) උත්ථාන වූ ජේසුස් වහන්සේ හමුවීමට පෙර පාවුල්ගේ ක්‍රියාකලාපය කුමක් වී ද?

(ii) තරුණ පාවුල්ගේ ජීවිත පසුබිම ඔහුගේ හැරීමෙන් පසු ධර්මදූත සේවයට කෙසේ පිටිවහලක් වූයේ දැ'යි දැක්වීමට උදාහරණ **තුනක්** සංක්ෂිප්තව ඉදිරිපත් කරන්න.

(iii) ක්‍රිස්තුන් වහන්සේ නිසා යහපත් ජීවිත පරිවර්තනයක් ඇති කර ගත් පුද්ගලයකු තුළ දැකිය හැකි ගුණාංග පාවුල්ගේ ජීවිත ආදර්ශය මගින් අනාවරණය කරන්න. (ලකුණු 10යි)

* * *

PAST PAPERS WIKI